**රාජ්‍ය භාෂා කොමිෂන් සභාව - 2017**

-------------------------------------------

රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන පිළිබඳ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතේ 17(3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපති වෙත 2018 ජුලි 12 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවැරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

--------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම් ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් නිශ්චිත ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනා නොගෙන ලැබෙන ප්‍රාග්ධන ප්‍රදාන සමුච්චිත අරමුදලට සෘජුවම ප්‍රාග්ධනිත කරන බව ගිණුම්කරණ සටහන් යටතේ අනාවරණය කර තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ වටිනාකම රු.2,061,704 ක්වූ කාර්යාල උපකරණ සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු. 206,170 ක් ක්ෂය කර තිබුණි.

(ආ) කොමිෂන් සභාව ස්ථාපිත කර තිබූ අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ කාර්යාල බෙදීම් හා කාපට් කිරීම වෙනුවෙන් කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන ප්‍රදානවලින් දරන ලද රු.1,308,800 ක් පුනරාවර්තන වියදම් ලෙස ආදායම් ප්‍රකාශනයට ගලපා තිබුණද එම ප්‍රාග්ධන ප්‍රදාන ආදායම් යටතේ හඳුනාගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට මුදල් පොත අනුව ශේෂය රු. 71,520 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එම ශේෂය රු.106,370 ක් ලෙස රු.34,850 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1981 අංක 26 දරන සේවක අර්ථසාධක අරමුදල්(සංශෝධන) පනතේ 3 වන වගන්තිය | සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවීම ඊළඟ මාසයේ අවසන් දිනට පෙර සිදුකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මාස 05 ක දායක මුදල් රු.1,020,296 ක් දින 24 ක සිට මාස 04 ක් අතර කාල ප්‍රමාදයකින් පසුව ගෙවීම් කර තිබුණි. |

| | |
|---|---|
| (ආ) 1982 අංක 03 දරන සේවා නියුක්තියන්ගේ භාර අරමුදල් පනතේ 3.1 වගන්තිය | සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට දායක මුදල් ගෙවීම ඊළඟ මාසයේ අවසාන දිනට පෙර සිදුකළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මාස 07 ක දායක මුදල් රු. 211,769 ක් දින 20 ක සිට මාස 05 ක් අතර කාල ප්‍රමාදයකින් පසුව ගෙවීම් කර තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 103 හා 104 | වාහනයක් අනතුරට ලක් වීමෙන් සිදුවූ රු.24,000 ක අලාභය සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 396 | නිකුත් කළ දින සිට මාස 6 ඉක්මවූ ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ රු. 162,900 ක් වූ චෙක්පත් 57 ක් සම්බන්ධයෙන් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 371(2)(ආ) හා 2015 ජුලි 14 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 08 කදී ලබා දී තිබූ තත්කාර්ය අතුරු අග්‍රිම එකතුව රු.219,650 ක් මාස 2 1/2 ත් මාස 31/2 ත් අතර කාල ප්‍රමාදයකින් පසුව පියවා තිබුණි. |
| (ඈ) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.6 වගන්තිය | සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2018 අගෝස්තු 05 දින වනවිටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.6,818,913 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,705,554 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලය රු.4,113,359 ක පිරිහීමක් නිරීක්ෂණය විය.සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ප්‍රදාන රු.417,300 කින් අඩුවීම හා ක්ෂය, අලුත්වැඩියා හා නඩත්තු වියදම් පිළිවෙළින් රු.1,978,898 කින් හා රු. 1,719,831 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලය පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේදී පැවති රු.3,131,575 ක ඌනතාවය ක්‍රමිකව අඩු වී 2015 වර්ෂයේදී අතිරික්තයක් බවට පත්වුවද, නැවතත් 2016 වර්ෂයේදී ඌනතාවයක් බවට පත්වී 2017 වර්ෂයේ දී එම ඌනතාවය රු.6,818,913 ක් දක්වා විශාල ලෙස වැඩිවී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේ දී රු.6,545,326 ක් වූ දායකත්වය 2015 වර්ෂයේදී රු. 17,670,540 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වුවද, 2016 වර්ෂයේ සිට අඩුවෙමින් 2017 වර්ෂයේ දී රු.12,150,773 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

කුලී ගොඩනැගිල්ලක ස්ථාපිත කර තිබූ කොමිෂන් සභා කාර්යාලය එම ගොඩනැගිල්ලෙන් ඉවත් කර 2017 නොවැම්බර් මාසයේදී අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ ස්ථාපිත කර තිබුණද 2018 ජනවාරි දක්වා මාස 02 ක කාලයක් වෙනුවෙන් කුලී ගොඩනැගිල්ලේ හිමිකරු වෙත රු.900,000 ක ගොඩනැගිලි කුලිය හා දිනකට රු.25,000 බැගින් වූ රු.1,550,000 ක්වූ දෛනික ගාස්තුව ලෙස එකතුව රු.2,450,000 ක් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි.

### 4.2 නිෂ්ක්‍රිය වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාවට අයත් මෝටර් රථයක් 2017 අගෝස්තු 27 සිට 2018 ජූලි 12 දක්වා මාස 11 ක පමණ කාලයක සිට භාවිතයට ගෙන නොතිබුණි.

(ආ) අවශ්‍යතාවය නිසිපරිදි හඳුනාගැනීමකින් තොරව 2012 වර්ෂයට පෙර සිට මුද්‍රණය කර තිබූ පාරිභාෂික පදමාලා හා පාඨමාලා පොත් 12,652 කින් සමාලෝචිත වර්ෂය අවසානයට වටිනාකම රු. 773,815 ක් වූ පොත් 9,855 ක් එනම් සියයට 78 ක් ඉතිරිව තිබුණි.

### 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

2017 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 41 ක් වූ අතර, තත්‍ය කාර්ය මණ්ඩලය 24 ක් වීමෙන් පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 17 ක් විය. 2016 වර්ෂයේ සිට පැවති පුරප්පාඩු 15ක් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම පිරවීමට කටයුතු කර නොතිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.

(ආ) ඉහත පරිදි වසර 2030 "න්‍යාය පත්‍රය" පිළිබඳව දැනුවත් වීම මත රාජ්‍ය භාෂා කොමිෂන් සභාව විසින් සිය විෂය පථයට අනුව ලඟා කර ගත යුතු අරමුණු වශයෙන් "අසමානතා අවම කිරීම" හඳුනාගෙන තිබුණද, ඒ හා සම්බන්ධ වන ඉලක්ක හා එම ඉලක්ක කරා ලඟා විය යුතු සන්දිස්ථානයන්ද ප්‍රගතිය මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 6.1 ප්‍රසම්පාදනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දී රාජ්‍ය භාෂා කොමිෂන් සභාව විසින් රු.715,670 ක්වූ ලේසර් ප්‍රින්ටර් 03 ක් හා කාර්යාල උපකරණ මිලදී ගැනීමේදී මිල කැඳවූ දින සිට ආයතනයට භාණ්ඩ ලැබීමේ (GRN නිකුත් කළ දිනය) දිනය දක්වා පිළිවෙලින් සති 20 ක් හා සති 19 ක් ගතකර තිබූ බැවින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (අ) වගන්තියේ දක්වා ඇති අරමුණට බැහැරව කටයුතුකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී වටිනාකම රු.2,134,760 ක් වූ ප්‍රසම්පාදන කාර්යයන් 06 ක් සිදුකර තිබුණද ඒවා ප්‍රසම්පාදන සැලසුමට ඇතුළත් වී නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | ගනුදෙනු වටිනාකම් නිවැරදිව ලෙජරයේ නොදැක්වීම හා අනුමත කර තිබූ ජර්නල් සටහන් නිවැරදිව ගිණුම් ගත නොකිරීම |
| (ආ) පොත්පත් හා ලේඛන පැවැත්වීම | තොග පොත් යාවත්කාලීන නොකිරීම හා මුදල් පොතේ වැය ගිණුම් අංක නිවැරදිව සටහන් නොකිරීම. |
| (ඇ) ප්‍රසම්පාදනය | පරිගණක උපාංග සහ කාර්යාල උපකරණ මිලදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3 (අ), 6.3.6 හා 7.9.2 මාර්ගෝපදේශවලට අනුව කටයුතු නොකිරීම. |